# සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි
# විධායක නිලධර ගණය
# (ජීව වෛද්‍ය ඉංජිනේරු)
# සඳහා වන
# බඳවා ගැනීමේ පරිපාටිය.
# (SL 01 2006)

(586)


දුරකථන / தொலைபேசி இல. / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலை - நகல் / Fax: 011-2369305, 011-2369302
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
## அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.


මගේ අංකය / எனது இல. / My No. PSC/EST/3/1/13/4/2013
ඔබේ අංකය / உமது இல. / Your No. 06/E/B.Eng./Recru./01/2013
දිනය / திகதி / Date 2014.04.03

අධ්‍යක්ෂ (පාලන) 06 — 11 APR 2014
09 APR 2014 — අතිරේක ලේකම් — කොළඹ - 10.
05 APR 2014

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

<u>විධායක නිලධර ගණය (SL 01 - 2006) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2014.03.14 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් උක්ත බඳවා ගැනීමේ පරිපාටියේ මුල් පිටපත මේ සමඟ එවමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීම් පරිපාටිය ඔබ කාර්යාලයේ වෙබ් අඩවියේ පළකරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

බී.එම්.බී.එම්.ජේ. බටුගෙදර
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

DDG (A)

<u>පිටපත්</u> : 01. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව ( මුල් පිටපත මේ සමඟ එවමි )
02. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ( මුල් පිටපත මේ සමඟ එවමි )

3024

(17)


011-2136600
011-2136650
011-2136700

011-2136602

011-2369302
011-2369305

sec-psc@sltnet.lk

www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாரஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.


මගේ අංකය / எனது இல. / My No. PSC/EST/3/1/13/4/2013

ඔබේ අංකය / உமது இல. / Your No. 06/E/B.Eng./Recru./01/2013

දිනය / திகதி / Date 2013.12. 23

27 DEC 2013 අතිරේක ලේකම් කොළඹ - 10.

SECRETARY 24 DEC 2013 MINISTRY OF HEALTH

Addi Sec/Ad

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

**විධායක නිලධර ගණය (SL 01 2006) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2013.08. දින රහිත ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මඟින් ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ විධායක නිලධර ගණය (SL 01 2006) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ඇමුණුමේ සඳහන් සංශෝධනයන්ට යටත්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2013/12/20 දින අනුමත කර ඇති අතර, එම සංශෝධන අනුව සකස් කල ඉහත බඳවා ගැනීම් පරිපාටියේ මුල් පිටපත් 01 ක් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අත්සන සඳහා ඉදිරිපත් කරන ලෙස කාරුණිකව දන්වමි.

[illegible] එම්.ජේ. බටුගෙදර
අතිරේක ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත් : 1) ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව.
2) ආයතන අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

## සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි
## විධායක සේවා ගණය (ජීව වෛද්‍ය ඉංජිනේරු) සඳහා වන
## බඳවා ගැනීමේ පරිපාටිය.

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : අදාල නොවේ

1.2 අමාත්‍යාංශය : සෞඛ්‍ය යොමු අංකය :06/E/B.Eng./Recru./01/2013 දිනය :2013.01.16

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම } යොමු අංකය : DMS/C1/H&N/C-Vol.ii දිනය : 2013.01.22

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය යොමු අංකය :EST-3/RECRU/04/6639 දිනය:2012.12.10

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය } යොමු අංකය :NSCC/4/13/SR-11 දිනය:2012.12.24

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය } යොමු අංකය : PSC/EST/3/1/13/4/2013 දිනය: 2013.12.20

**02. පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : විධායක

3.2 ශ්‍රේණි : III , II , සහ I ශ්‍රේණි

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : ජීව වෛද්‍ය ඉංජිනේරු අංශයේ පොදු ස්වභාවය අනුව සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය උපකරණ අත්පත් කර ගැනීම , ඒවා කළමනාකරණය කිරීම , සේවා හා නඩත්තු කිරීම , වෛද්‍ය උපකරණ සම්බන්ධ පුහුණු කටයුතු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනය , ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම , විධානය/අණ දීම හා ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යයන්ට ඇතුළත් වූ ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ට පැවරෙන සමස්ථ කාර්ය භාරයේ වෛද්‍ය උපකරණ සඳහා අන්තර්ගත කාර්යයන් අතරින් තනතුරට නිශ්චිත කොට පවරාදෙනු ලබන කාර්යයන්.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි / තනතුරු වල ස්වභාවය** : ස්ථිර. විශ්‍රාම වැටුප් සහිත.

## 05. වැටුප්

5.1 **වැටුප් කේත අංකය** : විධායක - SL -1- 2006

5.2 **වැටුප් පරිමාණය** : විධායක - රු: 22,935-10x645-8x790-17x1050-53,555

5.3 **ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර**

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| III ශ්‍රේණිය | 1පියවර | රු: 22,935/- |
| II ශ්‍රේණිය | 12 පියවර | රු: 30,175/- |
| I ශ්‍රේණිය | 20 පියවර | රු: 36,755/- |

## 06. සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 **අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :**

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|---|
| 01. | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු) | I | 01 | i. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට අදාළ පරිපාලන සහ අධීක්ෂණය කටයුතු<br>ii. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ සාමාන්‍ය පරිපාලන කටයුතු<br>iii. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ශ්‍රී ලංකා ජාතික රෝහලට හා ශික්ෂණ රෝහල් වලට අවශ්‍ය සියළුම වෛද්‍ය උපකරණ අත්පත් කර ගැනීම, බෙදා හැරීම, නඩත්තු කිරීම, හා සේවා ආදි රාජකාරි කටයුතු වලදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ට නිවැරදි උපදේශාත්මක සේවා සැපයීම.<br>iv. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ, ඉංජිනේරුවන්ගේ රාජකාරි අධීක්ෂණය කිරීම හා ඔවුන් වෙත පැවරි ඇති රාජකාරි නිවැරදි අයුරින් ඉටුවන ආකාරයට ඔවුන් මෙහෙයවීම හා උපදෙස් ලබා දීම.<br>v. පළාත් සෞඛ්‍ය ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකයන්හි කළමනාකරණ කටයුතු.<br>vi. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි. |

| | | | | |
|---|---|---|---|---|
| 03. | අධ්‍යක්ෂ<br>(ජීව වෛද්‍ය ඉංජිනේරු) | II / III | 01 | i. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට අදාළ පරිපාලන සහ අධීක්ෂණය කටයුතු වල නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා)ට සහය වීම.<br>ii. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයේ සාමාන්‍ය පරිපාලන කටයුතු<br>iii. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින සියළුම ශික්ෂණ රෝහල්වලට අවශ්‍ය සියළුම වෛද්‍ය උපකරණ අත්පත් කර ගැනීම, බෙදා හැරීම, නඩත්තු කිරීම, හා සේවා ආදි රාජකාරි කටයුතු වලදී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා)ට නිවැරදි උපදේශාත්මක සේවා සැපයීම.<br>iv. ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා වැඩමුලිකවරුන්ගේ රාජකාරි අධීක්ෂණය කිරීම හා ඔවුන් වෙත පැවරී ඇති රාජකාරි නිවැරදි අයුරින් ඉටුවන ආකාරයට ඔවුන් මෙහෙයවීම හා උපදෙස් ලබා දීම.<br>v. ප්‍රසම්පාදන කමිටු සඳහා සහයෝගය ලබාදීම සහ වෛද්‍ය උපකරණ මිලදී ගැනීමේදි තාක්ෂණික පිරිවිතර සැකසීම.<br>vi. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| 03. | ජ්‍යෙෂ්ඨ ජීව වෛද්‍ය ඉංජිනේරු | | | i. ජීව වෛද්‍ය ඉංජිනේරු සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩල පුහුණු කරවීම.<br>ii. වෛද්‍ය උපකරණ මිල දී ගැනීම සම්බන්ධව ප්‍රසම්පාදන කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.<br>iii. සියළුම රෝහල් වල පවතින වෛද්‍ය උපකරණ නඩත්තු කිරීම හා කළමණාකරණය.<br>iv. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |
| 04. | ජීව වෛද්‍ය ඉංජිනේරු | II / III | 17 | i. වෛද්‍ය උපකරණ අවශ්‍යතාවයන් සැලසුම් කිරීම හා වෛද්‍ය උපකරණ මිල දී ගැනීම සඳහා ටෙන්ඩර්පත් සැකසීම.<br>ii. ප්‍රසම්පාදන කමිටු සඳහා සහයෝගය ලබා දීම සහ වෛද්‍ය උපකරණ මිල දී ගැනීමේ දී තාක්ෂණික පිරිවිතර සැකසීම.<br>iii. අනුයුක්ත කොට ඇති අංශයන්හි කාර්ය මණ්ඩලයෙහි සියළුම අධීක්ෂණ කටයුතු සිදු කිරීම.<br>iv. උපකරණ නඩත්තු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම ,අවශ්‍ය අමතර කොටස් නිසි පරිදි ඇණවුම් කිරීම හා නිසි පරිදි තොග පවත්වා ගෙන යාම.<br>v. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබා දීම.<br>vi. ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි |

6.2 **ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව** : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III,II,I ශ්‍රේණින් සියල්ලම ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

### 7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| අනු අංකය | අනුමත තනතුර | ධාරාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. | ජීව වෛද්‍ය ඉංජිනේරු | විවෘත | 100% |
| | | සීමිත | නැත |
| | | කුසලතා | නැත |

### 7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 **බඳවා ගන්නා ශ්‍රේණිය** : III ශ්‍රේණිය

7.2.2 **සුදුසුකම් :**

7.2.2.1 **අධ්‍යාපන සුදුසුකම්** : (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක විද්‍යුත් / විදුලි / යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව/ ජීව වෛද්‍ය ඉංජිනේරු පිළිබඳ උපාධියක් ලබා තිබීම

7.2.2.2 **වෘත්තීය සුදුසුකම්** : අදාළ නොවේ.

7.2.2.3 **පළපුරුද්ද** : විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4 **කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය

7.2.2.5 **වෙනත්** :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 **වයස :**

7.2.3.1 **අවම සීමාව** : අවුරුදු 21 ට නොඅඩු

7.2.3.2 **උපරිම සීමාව** : අවුරුදු 35 ට නොවැඩි

7.2.4 **බඳවා ගැනීමේ ක්‍රමය :**

7.2.4.1 **ලිඛිත විභාගය** : අදාළ නොවේ

7.2.4.2 **වෘත්තීය පරීක්ෂණය :** අදාළ නොවේ

7.2.4.3 **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු** : අදාළ නොවේ

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1 අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 50 | අදාළ නොවේ. |
| 2.පළපුරුද්ද | 20 | |
| 3. ක්ෂේත්‍රයට අදාලව පර්යේෂණ හා ප්‍රකාශන | 25 | |
| 4.සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 | |
| මුලු ලකුණු | 100 | |

සටහන :

1. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත , ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල මත හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරු වලට බඳවා ගනු ලැබේ.

7.2.4.4.1 **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.5 **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :** රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියෙහි දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 **සීමිත බඳවා ගැනීම** : අදාළ නොවේ

7.4 **කුසලතා පදනම මත බඳවා ගැනීම** : අදාළ නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| **කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග** | **කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද** | **කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/ වෙනත්** |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වැනි ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය.- ඇමුණුම 01 |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වැනි ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය.- ඇමුණුම 02 |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වැනි ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් වීමට පෙර | ලිඛිත පරීක්ෂණය.- ඇමුණුම 03 |

8.2 **කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද :** වසරකට දෙවරක්

8.3 **කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :**

**1 වන කාර්යක්ෂමතා කඩඉම** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**2 වන කාර්යක්ෂමතා කඩඉම** : විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

**3 වන කාර්යක්ෂමතා කඩඉම** :

## 09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිළධාරීන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 **III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.**

10.1.1 **සාමාන්‍ය කාර්ය සාධනය අනුව**

10.1.1.1 **සපුරාලිය යුතු සුදුසුකම් :**

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 **උසස් කිරීමේ ක්‍රමය** :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබු විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව .

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

(i) ජීව වෛද්‍ය ඉංජිනේරු හෝ සායනික ඉංජිනේරු හෝ වෛද්‍ය ඉලෙක්ට්‍රෝනික විද්‍යාව හෝ වෛද්‍ය තාක්ෂණ කළමනාකරණය හෝ වෛද්‍ය භෞතික විද්‍යාව හෝ යන ක්ෂේත්‍ර වලින් එකක් සඳහා පශ්චාත් උපාධියක් ලබා තිබීම.

(ii) සේවා ගණයේ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හත (07) ක් උපයාගෙන තිබීම.

(iii) උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

සංලක්ෂය :

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගෙ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු ය.

## 11. තනතුරු වලට පත් කිරීම

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් |
|---|---|
| 1.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් බී (ජීව වෛද්‍ය ඉංජිනේරු) | විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධරයෙකු වීම |
| 2. අධ්‍යක්ෂ (ජීව වෛද්‍ය ඉංජිනේරු) | විධායක සේවා ගණයේ නිලධරයෙකු වීම. |

11.2 තෝරා ගනු ලබන ආකාරය :

සේවා පළපුරුද්ද හා කුසලතාවය මත ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තනතුරු වලට පත් කරනු ලැබේ.

## 12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

I. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත්කිරීම් / බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ පටිපාටියෙහි විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.

II. බඳවා ගැනීම, සේවයේ යෙදවීම, විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ කොන්දේසි/ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයේ විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර පනවනු ලබන විධිවිධාන අදාළ වේ.

III. ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකෙරෙන බැවින් මෙම සේවක ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යභාරයක් ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට පැවරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

13. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පර්බාහිර වන්නා වූ අර්ථ නිරූපණ :**

I. **"සක්‍රිය සේවා කාලය"** යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය:** ඇමුණුම 04

15. **සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළවේ.**

16. **මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.**

සකස් කළේ අත්සන : ..........
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ර්.සෝමරත්න
තනතුර : වැ/බ.අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014.02.25

පරීක්ෂා කළේ අත්සන : ..........
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.වී.ඩී.සී. විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.3.18

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා )
නම :වෛද්‍ය පී.ජ්.මහීපාල
තනතුර : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
නිල මුද්‍රාව : ..........

දිනය : 10-03-14

යොමු අංකය : 06/E/B.Eng./Recru./01/2013

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි විධායක නිලධර ගණය(ජෛව වෛද්‍ය ඉංජිනේරු) SL-1-2006 වැටුප් පරිමාණයට අදාළ තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..........
නම : වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය : 14/03/2014

නිල මුද්‍රාව : ..........

යොමු අංකය : PSC/EST/3/1/13/4/2013

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි විධායක නිලධර ගණය(ජෛව වෛද්‍ය ඉංජිනේරු) SL-1-2006 වැටුප් පරිමාණයට අදාළ තනතුරු සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2013-12-20 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ..........
නම : ..........
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014.03.31

නිල මුද්‍රාව : ..........

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

ඇමුණුම - 01

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි ජිව වෛද්‍ය ඉංජිනේරු සඳහා**

**III ශ්‍රේණියේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

01. **විභාගයේ නම** : ජිව වෛද්‍ය ඉංජිනේරු සේවා ගණය (SL-1-2006(ඒ)) III ශ්‍රේණිය සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන රෙගුලාසි | පැය 03යි | 100 | 40 % |
| 2. මුල්‍ය ක්‍රම | පැය 03යි | 100 | 40 % |
| 3. දෙපාර්තමේන්තු රෙගුලාසි | පැය 03යි | 100 | 40 % |

03. **පවත්වනු ලබන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. **පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :** වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.ආයතන රෙගුලාසි | ආයතන සංග්‍රහයේ<br><br>11 පරිච්ඡේදය - සේවයට බඳවා ගැනීමේ කාර්ය පරිපාටි හා පත් කිරීම්<br>V පරිච්ඡේදය - මුදා හැරීම, කලින් දැරූ තනතුරට පෙරලා යැවීම හා සේවය අවසන් කිරීම.<br>X11 පරිච්ඡේදය - නිවාඩු<br>XV පරිච්ඡේදය -අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම.<br>XVI පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XXV111 පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි සහ විධි<br>XXX පරිච්ඡේදය - රජයේ නිලධාරීන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXX111 පරිච්ඡේදය - නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග<br>XLV11 පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම සහ විනය<br>XLV111 පරිච්ඡේදය - විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති |

| | |
|---|---|
| | * අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ<br>III වැනි පරිච්ඡේදය - පත් කිරීම්<br>V වැනි පරිච්ඡේදය - රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තන්<br>VI වැනි පරිච්ඡේදය - පත් කිරීම් කෙරෙහි බලපාන නියමයන් කොන්දේසි<br>VII වැනි පරිච්ඡේදය - පත් කිරීම් වලදී අනුගමනය කල යුතු පරිපාටිය<br>VIII වැනි පරිච්ඡේදය - පරිවාස කාලය, වැඩ බැලීමේ කාලය හා පත්වීම ස්ථිර කිරීම<br>XIV වැනි පරිච්ඡේදය - පත්වීම අවසන් කිරීම හා රජයේ සේවයෙන් ඉල්ලා අස්වීම<br>XV වැනි පරිච්ඡේදය - තනතුර අතහැර යාම |
| 2. මූල්‍ය ක්‍රම | මුදල් රෙගුලාසි සංග්‍රහය<br>I පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තුව.<br>II පරිච්ඡේදය - වියදම්, අත්හැර දැමීම්, ආපසු ගෙවීම් ආදිය සඳහා අධිකාර බලය.<br>III පරිච්ඡේදය - මුදල් පාලනය හා ගිණුම් ගත කල හැකි වීම.<br>IV පරිච්ඡේදය - ලැබීම්.<br>V පරිච්ඡේදය - ගෙවීම්.<br>VI පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල යනාදියේ භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්.<br>X පරිච්ඡේදය - උසාවිවල ගිණුම්<br>XI පරිච්ඡේදය - විදේශ ආධාර<br>XIII පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා<br><br>* රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය |
| 3. දෙපාර්තමේන්තු රෙගුලාසි | රෝගී සත්කාර සේවාව සහ ප්‍රජා සෞඛ්‍ය සේවාවට අදාලව චක්‍රලේඛ උපදෙස් හා රෙගුලාසි |

සකස් කළේ අත්සන : HAI Somratt..............
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර :වැ./බ. අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014.02.25.......

පරීක්ෂා කළේ අත්සන : ..............................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.වී.ඩී.සී. විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.3.[illegible]...

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම :වෛද්‍ය පී.ජී.මහිපාල
තනතුර :සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 10-03-14
නිල මුද්‍රාව : ........................................

## ඇමුණුම - 02

## සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ජීව වෛද්‍ය ඉංජිනේරු

## II ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

01. **විභාගයේ නම** : ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ගණය (SL-1-2006(ඒ)) II ශ්‍රේණිය සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.විෂයය දැනුම | පැය 02යි | 100 | 40 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1.විෂයය දැනුම | ජීව වෛද්‍ය ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළව ප්‍රශ්න පත්‍රය සැකසේ. |

සකස් කළේ අත්සන : HAI Samarath..............
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර :වැ./බ. අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014.02.25.......

පරීක්ෂා කළේ අත්සන : ..................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.ටී.ඩී.සී. විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.3.5.......

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................................................
(දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම :වෛද්‍ය පී.ජී.මහීපාල
තනතුර :සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 10-03-14..............................
නිල මුද්‍රාව : ..............................

ඇමුණුම - 03

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි ජීව වෛද්‍ය ඉංජිනේරු**

**I ශ්‍රේණියේ තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

01. **විභාගයේ නම** : ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ගණය (SL-1-2006(ඒ)) I ශ්‍රේණිය සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. **විභාගය පිළිබඳ විස්තර** :

| ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සිද්ධි අධ්‍යයනය | පැය 03යි | 100 | 60 % |

03. **විභාගය පවත්වනු ලබන බලධරයා** : විභාග කොමසාරිස් ජනරාල් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. **විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග** : වසරකට දෙවරක්

05. **විභාගය සඳහා වන විෂය නිර්දේශය** :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සිද්ධි අධ්‍යයනය | තනතුරට අදාල ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නිර්මාණය කරනු ලබන ගැටළු සහගත සිද්ධීන් එකක් හෝ වැඩිගණනක් ආශ්‍රයෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කරනු ලැබේ. එමගින් අපේක්ෂකයින්ගේ තර්ක ශක්තිය, නිර්මාණශීලීත්වය, ගැටළු විශ්ලේෂණය යනාදිය හා නිවැරදි තීරණ ගැනීම හැකියාව සහ න්‍යායාත්මක දැනුම ප්‍රායෝගිකව යොදා ගැනීම පිළිබඳව ඔවුන් තුළ පවත්නා අවබෝධය පරීක්ෂාවට භාජනය කරනු ලැබේ.<br>සිද්ධි අධ්‍යයන 03 කට පිළිතුරු සැපයිය යුතුය. |

සකස් කළේ අත්සන : ...[signature]...
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : එච්.ඒ.ඊ.සෝමරත්න
තනතුර : වැ./බ. අධ්‍යක්ෂ (පාලන) 06
දිනය : 2014.02.25

පරීක්ෂා කළේ අත්සන : ...[signature]...
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)
නම : කේ.ටී.ඩී.සී. විමලසිරි
තනතුර : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2014.3.8

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ...[signature]...
(දෙපාර්තමේන්තු ප්‍රධාන )
නම :වෛද්‍ය පී.ජී.මහිපාල
තනතුර :සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 10-03-14
නිල මුද්‍රාව : ...[stamp]...

## ඇමුණුම - 04

## සෞඛ්‍ය අමාත්‍යාංශයෙ හි ජීව වෛද්‍ය ඉංජිනේරු

## සේවයේ යෙදී සිටින්නන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කිරීම

## ( මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.)

නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/2006 මගින් ලබා දී ඇති SL 01- 2006 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සේවා කාලය ගණන් ගනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වෙතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 .4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

(i) SL 01 -2006 III ශ්‍රේණිය

(අ) SL 01 -2006 III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු 10 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්

(ආ) SL 01 -2006 III ශ්‍රේණියට අදාළ වැටුප් පියවර ලබා දී ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසයින් අවුරුදු 10 කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ ද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්

SL 01 -2006 III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) SL 01 -2006 II ශ්‍රේණිය

(අ) දැනට පවතින බඳවා ගැනීමේ පටිපාටිය යටතේ වූ කාර්යක්ෂමතා කඩඉම් හා අනෙකුත් සේවා අවශ්‍යතා සම්පූර්ණ කරන ලද SL 01 -2006 III ශ්‍රේණියට අදාළ තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරීන්

SL 01 -2006 II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii) SL 1 -2006 I ශ්‍රේණිය

දැනටමත් SL 01 -2006 I ශ්‍රේණියට අදාළ තනතුරකට ස්ථිරව පත් කර ඇති නිලධාරීන් SL 01 -2006 I ශ්‍රේණියටඅන්තර්ග්‍රහණය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| සකස් කළේ අත්සන | : (signature) | පරීක්ෂා කළේ අත්සන | : (signature) |
| | (විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා) | | (විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා) |
| නම | : එච්.ඒ.ට්.සෝමරත්න | නම | : කේ.වී.ඩී.සී. විමලසිරි |
| තනතුර | :වැ./බ. අධ්‍යක්ෂ (පාලන) 06 | තනතුර | : වැ/බ.නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I |
| දිනය | : 2014. 02. 25 | දිනය | : 2014. 3. 6 |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : (signature)

(දෙපාර්තමේන්තු ප්‍රධාන )

නම :වෛද්‍ය පී.ජ්.මහීපාල

තනතුර :සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය : 10 - 03 - 14

නිල මුද්‍රාව : (stamp: සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය)